කාල් මාක්ස්

# පොයර්බාහ් ගැන තීසිස (ප්‍රවාද)

1

පොයර්බාහ්ගේ භෞතික වාදය ඇතුළුව, මෙතෙක් පවතින භෞතික වාදයේ මූලික අඩු පාඩුව නම්, දේ, සත්භාවය, ඉන්ද්‍රිය ගෝචරතාවය ලබාගන්නේ වස්තුවෙන් නැතිනම් උපනිද්ධ්‍යානයෙන් මිස, මිනිස් ඉන්ද්‍රිය ගෝචර ක්‍රියාකාරීත්වයෙන්, ව්‍යවහාරයෙන් සහ මනෝමූල වශයෙන් නොවීමය. ඒ නිසා, භෞතික වාදයට ප්‍රතිපක්ෂව ක්‍රියාකාරී පැත්ත විඥානවාදය විසින් වර්ධනය කෙරෙන තත්ත්වයක් ඇති විය. එහෙත් එය වියුක්ත ලෙස පමණකි. මන්දයත්, සත්තකින්ම විඥානවාදය සැබෑ, ඉන්ද්‍රිය ගෝචර ක්‍රියාකාරීත්වය නියම ලෙස නොදන්නා බැවිනි. චින්තන විෂයයන්ගෙන් ඉන්ද්‍රිය ගෝචර විෂයයන් සත්තකින්ම වෙන් කර ගැනීමට පොයර්බාහ්ට වුවමනා වී ඇත. එහෙත් ඔහු මිනිස් ක්‍රියාකාරීත්වය විෂයබද්ධ ක්‍රියාකාරීත්වය ලෙස නොගනී. එහෙයින් 'ක්‍රිස්තුලබ්ධියේ හරය' නැමැති කෘතියෙහි න්‍යායික ආකල්පය පමණක් නියම මිනිස් ආකල්පයක් ලෙස ඔහු ගණන් ගන්නා අතර ව්‍යවහාරය ඔහු බලන්නේ එහි නීච හා ජාවාරම් පැත්තෙන් පමණකි. ඒ නිසා ඔහු 'විප්ලවීය' වූද 'ව්‍යවහාරික විවේචක වූද ක්‍රියාකාරීත්වයේ' වැදගත්කම වටහා නොගනී.

2

වාස්තවික සත්‍යය මිනිස් චින්තනයට ආරෝපණය කළ හැකිද යන ප්‍රශ්නය හුදු න්‍යායික ප්‍රශ්නයක් නොව, ව්‍යවහාරික ප්‍රශ්නයකි. ව්‍යවහාරයේදී මිනිසා ඔහුගේ චින්තනයේ සත්‍යතාව එනම් එහි ක්‍රියාශීලීභාවය, බලය හා ලෞකිකත්වය ඔප්පු කළ යුතුය. ව්‍යවහාරයෙන් බැහැර වූ චින්තනයේ ඇති සත්‍යතාව සහ අසත්‍යතාව පිළිබඳ විවාදය හුදු පණ්ඩිත විචාරත්වයක් පමණකි.

3

මිනිසුන් වූ කලී තත්ත්වයෙන්ගේ සහ ශික්ෂණයේ නිෂ්පාදිතයෙකැයි භෞතිකවාදී උගැන්වීම කියන අතර ඒ හේතුව නිසා වෙනස් වූ මිනිසුන් වෙනස් වූ තත්ත්වයන්ගේ සහ ශික්ෂණයේ නිෂ්පාදිතයෙකැයි කියයි. එහෙත් තත්ත්වය වෙනස් කරනු ලබන්නේ මිනිසුන් විසින් බවද, ශික්ෂකයා ශික්ෂණය ලබා සිටිය යුතු බවද එම උගැන්වීම අමතක කරයි. මේ නිසා මෙම උගැන්වීම සමාජය කොටස් දෙකකට නොවැලැක්විය හැකිසේ බෙදා එක් කොටසක් සමාජයට ඉහළින් (නිදසුනක් වශයෙන් රොබට් ඕවන්ගේ මෙන්) තබයි.

තත්ත්වයන්ගේ වෙනස් වීමේ සහ මිනිස් ක්‍රියාකාරීත්වයේ සම්පාතනය තේරුම් ගත හැක්කේත්, යුක්ති යුක්ත ලෙස වටහා ගත හැක්කේත් විප්ලවීය ව්‍යාපාරයකින් පමණකි.

4

ආගමික ආත්ම අන්සතුකරණය, ලෝකය ආගමික, කල්පිත හා සැබෑ ලෝකයක් ලෙස ද්විගුණ කිරීම නැමැති සත්‍යයෙන් පොයර්බාහ් පටන් ගනී. ආගමික ලෝකය එහි ලෞකික පදනම් දක්වා දියකර හැරීමෙහි ඔහු යෙදී සිටී. මෙම කාර්යය සපුරාලීමෙන් ඉක්බිතිව, ප්‍රධාන දේ තවමත් ඉටුකර නැති බව ඔහු නොදකී. ලෞකික පදනම තමාගෙන් මුක්ත වී, ස්වාධීන රාජ්‍යයක් සේ ස්වර්ගයේ එය විසින්ම ස්ථාපිත වීම, විස්තර කළ හැක්කේ ලෞකික පදනමේ ස්වයං භේදය සහ ස්වයං ප්‍රතිවිරුද්ධතාවය මගින් පමණකි. එනිසා පසු කී දෙය ප්‍රථමයෙන්ම සිය ප්‍රතිවිරුද්ධතාවයෙහි අවබෝධ කර ගත යුතුය. ඉන් ඉක්බිතිව විප්ලවීය ව්‍යවහාරය තුළින් එම ප්‍රතිවිරුද්ධතාවය ඉවත් කරලිය යුතුය. ඒ අනුව නිදසුනක් වශයෙන් ශුද්ධ වූ පවුලේ රහස ලෞකික පවුලෙන් හෙළි කර ගත් විට ලෞකික පවුල න්‍යායික විවේචනයට සහ විප්ලවීය ව්‍යවහාරයට භාජනය කළ යුතුය.

5

වියුක්ත චින්තනයෙන් සෑහීමට පත් නොවන පොයර්බාහ් ඉන්ද්‍රිය බද්ධ උපනිද්ධ්‍යනයට ආයාචනය කරයි. එහෙත් ඔහු ඉන්ද්‍රිය බද්ධතාවය ව්‍යවහාරික, මිනිස් ඉන්ද්‍රිය බද්ධ ක්‍රියාකාරීත්වය ලෙස තේරුම් නොගනී.

6

ආගමික හරය මානුෂික හරය දක්වා පොයර්බාහ් විසඳාලයි. එහෙත් මානුෂික හරය එක් එක් පුද්ගලයකුට ආවේණික වියුක්තියක් නොවේ. එහි සද්භාවය අනුව එය සමාජයික සබඳතාවන්ගේ සමස්ථය වන්නේය.

මේ වාස්තවික හරය අරබයා විවේචනයක් ඉදිරිපත් නොකරන පොයර්බාහ්ට
පහත සඳහන් දේ පිළිගැනීමට සිදුවී ඇත:

1. ඓතිහාසික ක්‍රියාදාමයෙන් වෙන් කර ගෙන ආගමික හැඟීම (Gemut) ඒකෙක ලෙස ගණන් ගැනීම සහ වියුක්ත-හුදකලා-මිනිස් පුද්ගලයෙකු පූර්ව කාල්පනික කිරීම.

2. එබැවින් ඔහු ඉදිරිපත් කරන මිනිස් හරය ගණන් ගත හැක්කේ ''ජාන ප්‍රවේණිය'' හැටියටත්, බොහෝ පුද්ගලයන් ස්වභාවික ලෙස එක්සත් කරලන හුදු අභ්‍යන්තරික, ගොළු පොදුතාවයක් හැටියටත් පමණකි.

7

ඒනිසා ආගමික හැඟීම සමාජයික නිෂ්පාදනයක් බවත්, තමා විසින් විශ්ලේෂණයට භාජනය කරනු ලබන පුද්ගලයා වාස්තවික ලෙස සමාජයේ නියමිත රූපකාරයකට අයත් බවත් පොයර්බාහ් නොදකී.

8

සමාජයික ජීවිතය මූලික වශයෙන් ව්‍යවහාරිකය. න්‍යාය ගුඪවාදයට යොමුකරන සියළු අභිරහස් සිය යුක්ති යුක්ත පිළියම මිනිස් ව්‍යවහාරය තුළත්, මෙම ව්‍යවහාරයේ අවබෝධය තුළත් සොයා ගනී.

9

උපනිද්ධ්‍යානික භෞතිකවාදයට, එනම් ඉන්ද්‍රිය බද්ධතාවය ව්‍යවහාරික ක්‍රියාකාරීත්වයක් ලෙස වටහා නොගන්නා භෞතිකවාදයට ලැබිය හැකි උසස්තම ජයග්‍රහණය නම්, ''ප්‍රජා සමාජයේ'' තනි පුද්ගලයින්ගේ උපනිද්ධ්‍යානය පමණකි.

10

පැරණි භෞතිකවාදයේ ස්ථාවරය වූ කලී ''ප්‍රජා සමාජය'' වන්නේය; නව භෞතිකවාදයේ ස්ථාවරය වූ කලී මිනිස් සමාජය හෙවත් සමාජයික මිනිස් සංහතිය වන්නේය.

11

දාර්ශනිකයෝ ලෝකය විවිධාකාර ලෙස විවරණය කළහ; එහෙත්, කෙසේ වුවද ප්‍රධාන කරුණ නම් ලෝකය වෙනස් කිරීමය.

1845 වසන්තයේ කාල් මාක්ස්
විසින් ජර්මන් බසින් ලියවිණි.